**ශීර්ෂය -287 ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අප්‍රේල් 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය දෙපාර්තමේන්තුවට වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සංවර්ධන කාර්යයන් ඉටු කිරීමට වෙන් කළ මූලධන වැය විෂයන් 02 ක රු.2,584,264 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය ප්‍රතිශතයක් ලෙස සියයට 30 ත් 54 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | මූලධන වැය විෂය යටතේ හැකියා වර්ධනය වෙනුවෙන් රු.5,000,000 ක ප්‍රතිපාදන පැරණි ලේඛන සංරක්ෂණයට ලේඛන පරිලෝකනය සඳහා වෙන්කර එම කොන්ත්‍රාත්තුව රු.3,036,000 පවරන ලදී .මෙහිදී දුර්වල තත්වයේ තිබූ ලේඛන පිටු 1979ක් පරිලෝකනය කිරීමට බාර දුන් අතර එම ආයතනය කොටස් වශයෙන් වැඩ නිම කර බාරදීමේදී වැඩි කාලයක් ගතවීම හේතුවෙන් අපේක්ෂිත කාර්යයෙන් කොටසක් සඳහා පමණක් 2022තුළ ගෙවීම් කිරීමට සිදු විය. එසේම එම ලේඛන ප්‍රමාණය පරිලෝකනය කිරීම එම වසර තුළ සිදු කර ගැනීමට නොහැකි වීම සහ අපේක්ෂිත මුදලට වඩා අඩු ලංසුවක් පරිලෝකනය සඳහා ලැබීම නිසාත් මෙම ප්‍රතිපාදන මුදල් ඉතිරි වී තිබේ.වැය විෂය 2401පුහුණු හා හැකියා වර්ධනය යටතේ සියයට 54 ක් ඉතිරි වූයේ ජාතික අයවැය චක්‍රලේඛ 03/2022ට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා වියදම් දැරීම සීමා කිරීම හේතුවෙනි. | අනුමත ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතු ය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සටහන් අංක (iii)අනුවබැදීම් හා බැරකම් වල එකතු වටිනාකම රු.1,832,687 ක් වුවත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එය රු.262,150 ක් වුයෙන් රු.1,570,537 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය හා එකගවේ.මූල්‍ය ප්‍රකාශනවල සටහනේ දැක්වෙන බැදීම් හා බැරකම් වල එකතුව රු.1,832,687 කි.එහෙත් CIGAS පද්ධතියට ජනවාරි මස මාසික සාරාංශ ඉදිරිපත් කිරීම පෙබරවාරි 03දිනෙන් අවසන් වන නිසාත් එදිනට ලැබී ඇති බැරකම් පමණක් ඇතුළත් කර තිබේ.එහෙත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට දත්ත ඇතුළත් කිරීම සඳහා පෙබරවාරි 28දක්වා කාලයක් ලැබෙන නිසා එම කාලය අතරතුර පැමිණි සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබේ.ඒ අනුව CIGAS පද්ධතියට ඇතුළත් කළ වටිනාකම සාපේක්ෂව අඩුවීම නොවැලැක්විය හැකි කරුණකි. | වර්ෂයට අදාළ සියලුම බැරකම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ. 94 හා 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) ඡේදයට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් හතරකට අදාළව එකතුව රු. 825,273 ක බැරකම් වලට බැඳී තිබුණි. | වෙනත් දීමනා ඇතුළු පුනරාවර්තන වැය විෂයන් 04ක ඉතිරිවීම් මුදලට වඩා තවත් බැරකම්වලට බැඳීමට සිදු වූ බව පිළිගනිමි. පුරප්පාඩු නිසා වැඩ බැලීමේ පදනම මත නිලධාරින් පත් කිරීම. ලිපිද්‍රව්‍යවල මිල අසාමාන්‍ය ලෙස වැඩිවීම ,වාහන නඩත්තු වැනි හේතු වසරේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් කිරිමට සිදුවීම සහ ඊළඟ වසර තුළ ඉන්වොයිස් මේ වසරේ ලැබීම. | ඇස්තමේන්තු කිරීමේදී අනපේක්ෂිත වියදම් පිළිබද සැලකිලිමවත්ව කටයුතු කළ යුතු ය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරික්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | 273,353 | 2021 ඔක්තෝබර් 05 දින සේවය හැරගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.179,623 ක් සහ 2016 දෙසැම්බර් 30 දින වැඩ තහනමට ලක් කරන ලද නිලධාරියකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු. 93,730 ක ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව ඇපකරුගෙන්හෝ උරුමක්කාරයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කළ නිලධාරීයාට පැවති විධිමත් විනය පරීක්ෂණයේ අවසන් වාර්තාව හා චෝදනා පත්‍රය හා අධිකරණ තීන්දුව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යටත්ව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. විනය බලධරයාගේ විනය ක්‍රියාමාර්ග දැනුම් දුන් පසු ඒ පිළිබදව අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. එසේම දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවී පැමිණි 2021.10.05 දින සිට තනතුර හැර ගියනිලධාරියාට සියලුම අත්තිකාරම් සහ ණය මුදල් පියවන ලෙස ඔහුව දැනුවත් කර ඇති අතර ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4:5වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් පවති. එසේම ආපදා ණය මුදල් වෙනුවෙන් අත්සන් තබන ලද ඇපකරුවන්ගේ තොරතුරු එම අමාත්‍යාංශයෙන් ගෙන්වාගෙන අය කිරීමට කටයුතු කරනු ලැබේ. | අධිකරණතීන්දුව සහ ආයතන සංග්‍රහයේ නීතිරීති වලට අනුකූලව හිඟ ණය ශේෂ අය කර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය මු.රෙ. 104(3) | පාඩු හෝ අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාද වේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු වුවද 2022 මැයි 28 දින සහ 2022 මැයි 30 දින අනතුරටපත්වූ අංක PF 7866 සහ අංක PC 2375 දරන වාහන සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2023 මාර්තු 14 දින වන විටත් ප්‍රාරම්භක හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | PF 7866 අංක දරන වාහන අනතුර සම්බන්ධයෙන් මු.රෙ . (3)104වාර්තාව දක්වා කටයුතු මේ වන විට සිදු කර අවසන් වාර්තාව ලබාදීම සඳහා කමිටුව නම් කර ඇත .PC 2375 අංක දරන කැබ්රථය සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීම වෙනුවෙන් මූලික පරීක්ෂණය සඳහා නිලධාරියෙක් නම් කිරීම ප්‍රමාද වී ඇත.මේ වනවිට මු.රෙ.104(3)වාර්තාව ලබා දිය යුතු කාලය හා අවස්ථාව ඉකුත් වී ඇති බැවින්මු.රෙ.104(4) අවසන් වාර්තාව සකස් කිරීම සඳහා නිලධාරීන් පත් කර ඇත. | අදාල පරීක්ෂණ කඩිනමින් නිමකොට වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කර නොතිබුණි. | රා .පරි.ච 05/2008 .අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය මේ වන විට සකස් කර ඇත. | පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය මහජනයාට ප්‍රදර්ශනය කළ යුතුය. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛනයේ ඇමුණුම් 02 ආකෘතිය | මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | රා.පරි.චක්‍රලේඛ 02/2018අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් මේ වන විට සකස් කර ඇත. | අදාළ චක්‍රලේඛප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ ඇමුණුම් 01 ආකෘතිය | 2018 වර්ෂයේ පටන් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරිම සිදුකළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාර්ය සාධන ගිවිසුම් | දෙපාර්තමේන්තුවට අදාළ විෂයයන් ඇතුළත් සම්මත ක්‍රියාකාරකම් හඳුනා ගෙන ඇති අතර එම කාර්යයන් ඇතුළත් කාර්ය සාධන ගිවිසුම් සකස් කර එවීම සඳහා සියලුම නිලධාරීන් දැනුවත් කර ඇති බවද කාරුණිකව දන්වා සිටිමි. | කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අත්සන් කර නොතිබුණි. | | |
| (ඇ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 චක්‍රලේඛයේ 2.1 වගන්තිය | සියලුම රාජ්‍ය ආයතන විසින් විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා (Electronic Government Procument (E.G.P) Secretariat) 2020 ජනවාරි 31 දිනට පෙර ලියාපදිංචි විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මෙම විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි වී නොතිබුණි. | Electronic Government Procument (EGP) විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියට 2019වර්ෂයේදි අදාළ චක්‍රලේඛය අනුව සබැඳි අංක හරහා ප්‍රසම්පාදන කමිටු සහ සම්බන්ධිත නිලධාරින්ගේ නම් ආදී තොරතුරු ඇතුළත් කළද මෙතෙක් මේ සම්බන්ධයෙන් ප්‍රතිචාරයක් නැවත ලැබී නොමැත.රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් විමසා දැනගත් තොරතුරු අනුව නොපමාව Promise.lk වෙබ් අඩවිය හරහා ලියාපදිංචි වීමට ක්‍රියා කරන ලෙස උපදෙස් ලැබී ඇත .ඒ අනුව ක්‍රියාකිරිමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි විය යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1998 අංක 21 දරන හිමිකම් නිරවුල් කිරීමේ පනත සම්මත වීමෙන් අනතුරුව දිස්ත්‍රික්ක 03 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ආරම්භ කර ඇති බිම් සවිය වැඩ සටහන සමාලෝචිත වර්ෂයේදෙසැම්බර් 31 වන විට දිස්ත්‍රික්ක 18 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ක එම කටයුතු ආවරණය වන ලෙස ක්‍රියාත්මක වුවත් අනෙකුත් දිස්ත්‍රික්ක ඇතුළත්ව ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි කාලරාමුවක් ඇතුළත්ව ක්‍රියාකාරී සැලසුමක් සකස් කර නොතිබුණි. | බිම් සවිය වැඩසටහන සඳහා කාල රාමුවක් 2008වර්ෂයේ සකස් කර පසු කාලිනව සංශෝධනය වි වෙනස් වි ඇති අතර බලාපොරොත්තු වු මුල්‍ය ප්‍රතිපාදන නොලැබීම,ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි හිමිකම් නිරවුල් කිරිමේ කාර්යය ඉටුකිරිමට නොහැකි වීම,නිලධාරිපුරප්පාඩුව, මැනුම් ගැටළු විමර්ශන සඳහා නිලධාරීන් නොමැතිවි හා මැණුම් කටයුතු සඳහා මිනින්දෝරුවන් නොමැතිවීම තුලින් තවදුරටත් මෙම ක්‍රියාවලිය ප්‍රමාද වෙමින් පවතී.කෙසේ නමුත් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ප්‍රතිපාදන මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 86ක මේ වනවිට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. | සැලසුම් සකස් කර ලංකාව පුරා බිම් සවිය වැඩ සටහන ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 වර්ෂයේ සිට ඉඩම් අමාත්‍යාංශය යටතේ සමස්ත පිරිවැය රු. 5,911,050,000 ක් වැයකර ක්‍රියාත්මක වූ බිම්සවිය වැඩ සටහනට අදාළව පහත දුර්වලතා නිරීක්ෂණය විය. | | |
| (i) | 1998 බලංගොඩ, දිවුලපිටිය, උඩපළාත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ද 2002 දී හෝමාගම හා තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලක්‍රියාත්මක කර වසර 19 ත් 22 ක් අතර කාලයක් ක්‍රියාත්මක වුවත් ඒවා අවසන් කර නොතිබුණි. | විමර්ශන කාර්ය භාරය ඉටුකර සහතිකය ලබාදීම සඳහා දීර්ඝ කාලයක් ගතවන අතර විමර්ශන කිරීමෙන් අනතුරුව අධිකරණයෙහි පවතින නඩු හා අදාළ ඉඩම් හිමිකරුවන් දිවයිනෙන් බැහැරවීම වැනි අවස්ථා වලදී හිමිකම් විමර්ශන කටයුතු අවසන් කිරීමට නොහැකිවන අතර,බලංගොඩ ,දිවුලපිටිය , උඩපළාත ,හෝමාගම වැනි කාර්යාලයන්හි මෙවන් ගොනු විශාල ප්‍රමාණයක් එක් රැස්ව ඇත.එම ගැටළු වර්තමානය වනවිට ක්‍රමිකව විසඳෙමින් පවතී.එමෙන්ම පනතේ 55වන වගන්තිය අවසන් කැමැත්තක් නොලියා මියයන අවස්ථාවලදී උරුමකරුවන්ට ඉඩම් පැවරිම යටතේ විමර්ශනය කර සහතික යොමු කිරිමද මෙම කාර්යාල මගින් වර්තමානයේ සිදුවේ .කෙසේ නමුත් වර්තමානය වනවිට උක්ත කාර්යාල වසා දමා ඊට ආසන්නව පිහිටි කාර්යාලයන්ට ,වසා දැමූ කාර්යාලයන්හි ඉදිරි කටයුතු භාරදීම සිදුකරමින් පවතින අතර ඉදිරි වසර 02ක් තුළ එම කාර්යයන්ද ආරම්භ කිරිමට නියමිතව ඇත. | කඩිනමින් විමර්ෂණ කටයුතු සිදු කර ඉඩම් පැවරීම් සිදු කළ යුතු ය. |
| (ii) | මෙම වැඩසටහනආරම්භ කර වර්ෂ 16 ක් තුළදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 කට අදාළව මුළු ග්‍රාම නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව 3971 ක් පැවතියද, ඉන් 1468 ක පමණක් එනම් සියයට 37 ක පමණක් මැනුම් අවසන් කර තිබුණි. එසේම කොට්ඨාශ 9 කට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 207 ක මැනුම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | 1998 අංක (21)ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව ඉඩම් කොටස් සඳහා කැඩැස්තර මිනුම් සකස් කරනු ලබන්නේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසිනි.එම දෙපාර්තමේන්තුවට ප්‍රාදේශීය ලේකම් ,ඉඩම් කොමසාරිස් හා වෙනත් රජයේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් වලට අනුව මිනුම් කටයුතු සිදු කරමින් දෙපාර්තමේන්තු බිම්සවියට අදාළ මැනුම් කටයුතු කරනු ලැබේ . කෙසේ නමුත් මෙම දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ කොට්ඨාශයන් සඳහා මැනුම් ඉල්ලීම් යොමු කරනු ලබන්නේ එම කොට්ඨාශයට අදාළව අනුයුක්ත කර ඇති මිනින්දෝරුවන් සංඛ්‍යාව පදනම් කරගෙන වේ. එහිදි සිටින නිලධාරීන්ගෙන් මැනුම් ලබාගැනිමට සිදුවනු ඇත. | මිනිදෝරු දෙපාර්තමේන් තුව සමඟ සාකච්ඡා කර අදාළ මැනුම් කටයුතු කඩිනමින් ඉටුකරවා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2017 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 57 ක ක්‍රියාත්මක වී තිබුණු බිම් සවිය වැඩසටහන සමාලෝචිත වර්ෂය වන විට 66 ක් දක්වා කාර්යාල 09 කින් වර්ධනය වී ඇති අතර, එය රත්නපුර,කොළඹ,මහනුවර, පොළොන්නරුව, පුත්තලම, ගාල්ල ,මාතර යන දිස්ත්‍රික්ක 07 කට පමණක් සීමා වී තිබුණි. එසේම 2017 වර්ෂයේදි නුවරඑළිය, මොණරාගල, කෑගල්ල, යාපනය යන දිස්ත්‍රික්ක වල මෙම වැඩ සටහන ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වා වසර 05 ක කාලයක් ගත වුවද එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් කාර්යාලය බැගින් පවත්වා ගැනීම වෙනුවට එක් දිස්ත්‍රික්කයකට බිම්සවිය කාර්යාල එකක් පමණක් පවත්වාගෙන ගොස් තිබුණි. | රත්නපුර, කොළඹ, මහනුවර, පොළොන්නරුව, පුත්තලම, ගාල්ල, මාතර නුවරඑළිය, මොණරාගල, කෑගල්ල, යාපනය, යන දිස්ත්‍රික්ක වල බිම්සවිය ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරිම සඳහා විවිධ අවස්ථාවන් වලදී උත්සාහ කර ඇත. ඊට බාධකය ලෙස මෙම වැඩසටහන සඳහා වරකට අනුයුක්ත කරනු ලබන මිනින්දෝරුවන් සංඛ්‍යාව ප්‍රධාන වශයෙන් හේතුවී ඇති අතර සෑම දිස්ත්‍රික්කයක්ම වෙනුවෙන් ප්‍රමාණවත් මිනින්දෝරුවන් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීමේ හැකියාවක් නොමැති බව එම දෙපාර්තමේන්තුව දන්වා ඇත. මුළු දිවයින තුළ ඉඩම් කැබලි මිලියන 12 පමණ පවතින බව ගණනය කර ඇත.එම කැබලි ප්‍රමාණය මැනිම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් නිලධාරීන් 120 සහ පුද්ගලික මිනින්දෝරුවන් 100 ප්‍රමාණයක් පමණක් එක් වරකදි අනුයුක්ත කර ඇත.<br>ඒ අනුව සියලු මිනින්දෝරුවන් විසින් මැනුම් කටයුතු සිදුකළ ද වසරකදී මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන කඩයිම් සිතියම් වල අන්තර්ගත වනුයේ ඉඩම් කැබලි 7000 - 8000 ක ප්‍රමාණයක් පමණි.එසේම සිතියම් ප්‍රමාණයේ හිගයක් පවතී. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවට අදාළව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර/නියෝජ්‍ය කොමසාරිස්වරුන් හා සංවර්ධන නිලධාරි සේවයට අයත් විමර්ෂණ නිලධාරින් අනුයුක්ත කරන ලෙස කරන ලද ඉල්ලීම් සඳහා නිසි ප්‍රතිචාර නොලැබීම මත ඉතිරි දිස්ත්‍රික්ක සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ ගැටළු කාරී තත්වයක් උද්ගතව ඇත. | මිනිදෝරු දෙපාර්තමේන් තුව සමඟ සාකච්ජා කර අදාළ මැනුම් කට යුතු කඩිනමින් සිදු කළ යුතු ය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ බිම්සවිය වැඩසටහන සඳහා දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 48 ක් සඳහා ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් වෙනුවෙන් 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු.271,345,483 ක් ගෙවීම් කර තිබූ අතර 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව රජයේ ගොඩනැගිල්ල අදාළ කාර්යාලය පැවැත්වීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුළ පමණක් ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් ලෙස රු.50,500,200 ක් දරා තිබූ බව නිරීක්ෂණය විය. | දිවයින පුරා පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 48 අතරින් කාර්යාල 06ක් පවත්වාගෙන යනු ලබන්නේ රජයේ ගොඩනැගිලි වලය. පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලැබූ ඉතිරි කාර්යාල 42න් අයවැය චක්‍රලේඛ 03/2022 අනුව මේ වන විට කාර්යාල 02ක් රජයේ ගොඩනැගිලි වලට විතැන් කර ආරක්ෂක වියදම හා ගොඩනැගිලි කුලී අඩු කරගෙන ඇත. 2023 වර්ෂයට අදාළව අලුතින් ආරම්භ කරන ලද හා ආරම්භ කිරීමට නියමිත කාර්යාල සඳහා රජයේ ගොඩනැගිලි ලබාගෙන ඇත. රජයේ ගොඩනැගිලි ලබා ගැනීමට සියලුම දිස්ත්‍රික් ලේකම් වරුන්ගෙන් විමසීම් කර ඇති අතර ලැබෙන තොරතුරු මත කාර්යාල විතැන් කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. තවද හඳුනා ගත් ඌන භාවිත රජයේ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ලබා දෙන | දෙපාර්තමේන් තු ගනුදෙනු අවම පිරිවැයකින් සිදු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | ලෙසද මුදල් අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් දැනුවත් කර ඇත.අය වැය චක්‍රලේඛ අංක 03/2022 නිකුත් කර ඇත්තේ 2022 අප්‍රේල් මස 26 දිනැතිව වන අතර වසරක් වැනි කාලයක් තුළ සියලුම කාර්යාල සඳහා රජයේ ගොඩනැගිලි සොයා ගැනීම දුෂ්කර කාර්යයක් වන අතර අවස්ථාව ලැබෙන ප්‍රථම අවස්ථාවේදී ම රජයේ ගොඩනැගිලි සඳහා ප්‍රාදේශීය කාර්යාල විතැන් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වගන්තිය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගැසට් කළ මුළු කැබලි සංඛ්‍යාව වූ 1,561,909 න් සියයට 57 ක් හෙවත් කැබලි 898,125 ක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් අනුමත කර තිබුණද, සියයට 43 ක් මෙතෙක් අනුමත කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සිතියම් ගත කරන ලද සියලුම ඉඩම් කොටස් පනතේ 12 වන වගන්තිය යටතේ ගැසට් කරනු ලබයි. එම ගැසට් නිවේදනය පරිදි හිමිකම්පාන්නන් විසින් ඉදිරිපත් කරනු ලබන උරුම අයදුම්පත්‍රය (හි.නි.කො.ජ. 05) අනුව පනතේ 13 වන වගන්තිය යටතේ හිමිකම සනාථ කර ගැනීම සඳහා විමර්ශනයක් සිදු කරනු ලබයි. එම විමර්ශනයේදී අදාළ බිම් කොටස සම්බන්ධයෙන් හිමිකම් පාන්නාගේ නිරවුල් අයිතිය කොමසාරිස් ජනරාල් වෙත සනාථ වන අවස්ථාවේදී එම හිමිකම, පනතේ 14 වන වගන්තිය යටතේ අනුමත කර ගැසට් කරනු ලබයි. එසේම උක්ත විමර්ශනයේදී හිමිකම් පාන්නාට එම ඉඩම් කොටස සම්බන්ධයෙන් සිය නිරවුල් අයිතිය සනාථ කිරීමට නොහැකි වන බව කොමසාරිස් ජනරාල්වරයාට තහවුරු වන්නේ නම් එම ඉඩම් කොටස් 14 වන වගන්තිය යටතේ අනුමත කිරීමට නොහැකි වේ.මෙලෙස හිමිකම සනාථ කිරීමට නොහැකි වන හේතු සාධක වන කරුණු ප්‍රධාන වශයෙන් ශීර්ෂ 12 ක් යටතේ දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇත. ඒ සඳහා විසඳුම් ඍජුවම මෙම දෙපාර්තමේන්තුවට පමණක් ලබා දිය නොහැකි වන අතර ඒ ඒ ආයතන වෙත යොමු කර ලැබෙන විසඳුම් වලට සමාන්තරව නැවත 14 වන වගන්තිය යටතේ අනුමත කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි. තවද අධිකරණ තීන්දු ලබා දීම, ඉඩමේ හිමිකරු දීර්ඝ කාලීනව විදේශ ගතවීම වැනි සාධක මත පසෙක තබන ලද ඉඩම් කොටස් සම්බන්ධයෙන් තීරණ ලබා දීමට ද දීර්ඝ කාලයක් ගතවේ. එම සාධක දෙපාර්තමේන්තුවට පරිබාහිර හේතු මත සිදු වන බැවින් ඒ සඳහා අවසන් තීරණ ලබා දීම කඩිනම් කිරීමේ හැකියාවක් දෙපාර්මේන්තුව සතුව නොමැත. | ඉඩම් ලියාපදිංචි කිරීම් කටයුතු කාර්යක්ෂමව සහ කඩිනම්ව සිදු කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | වැඩ සටහන ආරම්භ කල 1998 වර්ෂයේ සිට මැනුම් කරන ලද ඉඩම් වලට පැන නැගී ඇති නීතිමය ගැටලු, හිමිකම් ගැටලු, | ඉහත 3.2(ඇ) වෙත ලබා දුන් පිළිතුර හා බැඳේ.බිම්සවිය වැඩසටහන තුළ නිරන්තරයෙන් ගොනු පසෙක තැබීම සහ එම පසෙක තැබූ ගොනු නැවත නිරවුල් කර සහතික ලබා දීම සිදු වේ. මෙය | පසෙක තබන ගොනු සම්බන්ධයෙ න් නිරන්තර |

| | | | |
|---|---|---|---|
| | මායිම් ගැටලු මෙන්ම, ප්‍රවේශ මාර්ග පිළිබඳ ගැටලු, හිමිකම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ නිරවුල් නොකළ ඉඩම් පැවතීම, විහාර දේවාලගම් පනත යටතේ විරෝධතා ඇතුලු විවිධ ගැටලු වර්ග 11 ක් හේතුවෙන් හිමිකම් සහතිකය නිකුත් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිව ප්‍රාදේශීය කාර්යාල 65 ක පසෙක තබා ඇති මුළු ගොනු සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 472,773 ක් වී තිබුණි. මෙම ප්‍රමාණය මෙතෙක් මැනුම් කර ගැසට් කර ඇති මුළු බිම් ප්‍රමාණය වූ 1,561,909න් සියයට 30 ක් පමණ වූ අතර දෙපාර්තමේන්තු විසින් පසෙක තබා ඇතිගොනු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කිරීම නිසියාකාරව සිදුනොවන බව නිරීක්ෂණය විය. | චක්‍රීය වශයෙන් සිදුවන අතර සෑම විට ම ගොනු ලක්ෂ 05ක පමණ ප්‍රමාණයක් පසෙක ගොනු ලෙස නිරීක්ෂණය වේ. එසේ නමුත් මෙම ගොනු අධිකරණමය ක්‍රියාමාර්ග ලෙස විසඳීම හෝ විදෙස්ගත පුද්ගලයින් විමර්ශන කාර්යයට සම්බන්ධ වීම මත නිරවුල් ක්‍රියාවලියට නැවත යොමුව සහතික පත් නිකුත් වේ. මෙම කාර්යය නිරන්තර අධ්‍යයනයකට ලක් කරමින් මෙම දෙපාර්තමේන්තු කටයුතු කරන අතර පසුගිය වසර තුළ පමණක් පසෙක තැබූ ගොනු මඟින් තීරණ ලබා දීම 2021 දී 9376 ක් ද 2022 දී 8465 ක් ද පමණ ඉටු කර ගත හැකි වී ඇත.ඒ අනුව පුහුණු අවස්ථා, ඒකාබද්ධ පරික්ෂණ හා නිරන්තර පසුවිපරම් මඟින් ක්‍රම ක්‍රමයෙන් පසෙක තැබූ ගොනු ප්‍රමාණයන් අඩු කරමින් සිටි. | පසු විපරම් කටයුතු සිදු කර කඩිනමින් අවශය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පසුගිය වසර 06 තුළ පසෙක තබන ලද එකතුව 167,322 ක් වූ ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් නැවත විසඳුම් ලබා දී තීරණ ගන්නා ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 58,823 ක් වූ අතර එහි ප්‍රගතිය සියයට 35 ක් විය.මෙය බිම් සවිය වැඩසටහනෙහි අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට බාධාවක් වී ඇති අතරම මහජනයාගේ ඉඩම් අයිතිය නිරවුල් කිරීම ප්‍රමාද වීම දැඩි ලෙස බලපා තිබුණි. | පසෙක තබන ලද ඉඩම් කොටස් නිරතුරුව පසු විපරම් සිදු කරනු ලබන අතර මහජනතාව විසින් හිමිකම තහවුරු කිරීමට අදාළ අත්‍යාවශ්‍ය නිවැරදි ක්‍රියා මාර්ග නොගැනීම හේතුවෙන් ලිපි ගොනු නැවත නැවත පසෙක තැබීම සිදු වේ. නිත්‍යානුකූලව කටයුතු කරනු ලබන මහජනතාවගේ හිමිකම අනුමත කිරීම කඩිනම්ව සිදු කරයි. එසේම පළාත්පාල ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආදි දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර ආයතනද දැනුවත් කරන අතර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කර නැවත ඉදිරිපත් විමේදී දෙපාර්තමේන්තුව කඩිනම්ව කටයුතු කරයි. එසේ වුවද මහජනතාවගේ පාර්ශවයෙන් ඉටුකල යුතු වගකීම ඉටු නොවීම හේතුවෙන්ද ගොනු පසෙක තැබීම දීර්ඝ කාලීනව සිදුව ඇත. එවැනි ඉඩම් කොටස් සඳහා හි.නි.කො.ජ. 13 ආකෘතිය මඟින් මහජනතාව දැනුවත් කිරීමද සිදුකරනු ලබයි. | බිම් සවිය වැඩසටහනෙහි අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට අවශය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේදෙසැම්බර් 31 දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 ක ඉඩම් රෙජිස්ට්‍රාර්ට යැවූ ඉඩම් කැබලි සංඛ්‍යාව හා ලැබුණු සහතිකපත් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු අනුව මෙම කාල පරාසය තුළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත බිම් කැබලි 42,833 ක් යවා තිබූ අතර ලද සහතික පත් සංඛ්‍යාව 22,524 ක් විය. එම කාර්යාල අතුරින් තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් කැබලි 780 ක් යවා තිබුණද, කිසිදු සහතිකයක් ලැබී නොතිබුණු අතර තිස්සමහාරාමය, හිඟුරක්ගොඩ යන කොට්ඨාශ වලද සහතික ලැබීම ප්‍රගතිය ඉතා පහළ අගයක පැවතුණි. | නිරවුල් ක්‍රියාවලිය රජයේ සහ පුද්ගලික ඉඩම් යන කාණ්ඩ දෙක ම නිරවුල් කරයි. පෞද්ගලික ඉඩම් සඳහා හිමිකම් සහතික නිකුත් කරනු ලබන අතර රජයේ ඉඩම් සඳහා හිමිකම් උපලේඛනගත කිරීම පමණක් සිදු කරනු ලබයි. එබැවින් මෙම කාර්යාලයන්හි නිකුත් කරන ලද හිමිකම් සහතික සංඛ්‍යාව පහළ අගයක් ගනී. | ඉඩම් හිමිකම් සහතික නිකුත් කිරීම පහළ මට්ටමක පවතින කාර්යාල හඳුනාගෙන වර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් ලද හිමිකම් සහතිකපත් සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිමිකරුවන් වෙත බෙදා නොදී අත ඉතිරි හිමිකම් සහතික ප්‍රමාණය 24,898ක් වුවත් මෙම ඉතිරිව පවතින සහතිකපත් සංඛ්‍යාව පිළිබඳව එක් එක් ප්‍රාදේශීය කාර්යාල වලින් කාල විශ්ලේෂණයක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය කාර්යාල යනු දෙපාර්තමේන්තුවේ කොටසක් වන අතර දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කිරීම සඳහා ස්ථාපිත ප්‍රාදේශීය ඒකකය ද වේ. ඒවායේ සහතික අත ඉතිරිව පැවතීම හේතුවෙන් කාල විශ්ලේෂණයක් ගෙන්වා ගැනීමේ ක්‍රියාවලියක් අත්‍යාවශ්‍ය නොවේ.කාල විශ්ලේෂණය කර සහතික පත් කාර්යාලයේ පවත්වා ගැනීම සඳහා නොව හැකි ඉක්මණින් හිමිකරු වෙත සහතිකපත් ලබා දීමට සියලු කාර්යාල දැනුවත් කර ඇත. | හිමිකම් සහතික පත් පිළිබඳ තොරතුරු පවත්වා ගැනීම සහ තොරතුරු පද්ධතිය පිහිටුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සතුව බිම් සවිය වැඩසටහන සම්බන්ධ දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් මෙතෙක් පිහිටුවා නොමැති වීම හේතුවෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති **e – land register** මෘදුකාංගය සමඟ ඒකාබද්ධ වී හිමිකම් විමර්ශන ක්‍රියාවලියේදී ඉඩම් ලේඛන, පත්තිරු පරීක්ෂා කිරීමේ පහසුකම් ලබා ගැනිමටද මෙතෙක් දෙපාර්තමේන්තුව අපොහොසත් වී | බිම් සවිය වැඩසටහන සම්බන්ධ දත්ත පද්ධතියක් (e-land hub)සකස් කිරිමට ඉඩම් අමාත්‍යාංශය 2014 වර්ෂයේදී ආරම්භ කර ඇතත් එම කටයුතු අවසන් වී නොමැත.මෙම වැඩසටහන ප්‍රධාන ආයතන 3 ක් ඒකාබද්ධව සිදු කරන බැවින් බිම්සවිය වැඩසටහන සඳහා එක් තොතුරු පද්ධතියක් අත්‍යාවශ්‍ය වේ.e-land hub පද්ධතිය නිම කිරිම සිදු නොවූ නිසා ඉඩම් නිරවුල් කිරිමේ දෙපාර්තමේන්තුව 2020 වර්ෂයේදී ආරම්භයක් වශයෙන් උපලේඛන මාර්ගගතව ගෙන්වා ගැනීම සඳහා e-Title නමින් මෘදුකාංගයක් සකස් කිරිම සිදු කරන ලදී. කොවිඩ් වසංගත තත්වය නිසා රට වසා තිබු බැවින් ,එහි වැඩි දියුණු කිරිම් කර ගැනීමට නොහැකි විය.2022 වර්ෂයේදී මිනින්දෝරු | හිමිකම් සහතික පත් පිළිබඳ තොරතුරු පවත්වා ගැනීම සහ තොරතුරු පද්ධතිය පිහිටුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. | දෙපාර්තමේන්තුව මඟින් කඩඉම් සිතියම්වල කළාප අංකයට අමතරව පත්‍ර අංකයක් භාවිතා කිරීම ආරම්භ කර ඇත.එම නිසා දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලද පද්ධතිය එම නව අංක ක්‍රමයට අනුව වැඩිදියුණු කර ගැනීමට අවශ්‍යවුවත්, රටේ ආර්ථික තත්වය නිසා මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව නව කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලබාදීමට නොහැකිවී ඇත.2023 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් එම කටයුතු සිදුකර ගැනීමට අවශ්‍ය පිරිවිතර සකස් කිරීම නිම කර ඇති අතර මිල ගණන් කැඳවීමේ කටයුතු සිදු කරමින් පවතී.ඉඩම් ලේඛන,පත්ඉරු පරීක්ෂා කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය මඟින් මුදල් වෙන්කර පරිගණක වැඩසටහනක් සකස් කරන ලදී. එමඟින් මාර්ගගතව (online) පත්ඉරු පරීක්ෂා කිරීමට හැකියාව පැවතිණි. වැඩසටහන ආරම්භ වී පුහුණු කටයුතු සිදු කළද රෙජිස්ටර් ජනරාල් දෙපාර්තමේන්තුවේ online මඟින් පත්ඉරු පරීක්ෂා කිරීමේ පද්ධතිය බිඳවැටී ඇති බැවින් එහි කටයුතු සිදු නොවේ. | |
| (ඵ) | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 7(1) වගන්තියේ සඳහන් පරිදි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් තුළ වූ එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් සමගි මණ්ඩලයක් පත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී කොට්ඨාශ 3971 න් 315 කට පමණක් සමඟි මණ්ඩල පත් කර තිබුණු අතර, ඉතිරි ග්‍රාම නිලධාරී කෙට්ඨාශ 3,656 ක සමඟි මණ්ඩල පත් කිරීමට කටයුතු කර නොමැති වීම සමස්ත ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. | මේ වන විට මෙම කාර්යය සම්පූර්ණ කර ඇත. | සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකම සමඟි මණ්ඩල ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.36,400,000 ක් වටිනා දෙපාර්තමේන්තුවට අයත් කොමසාරිස් ජනරාල්වරයාගේ බත්තරමුල්ලේ පිහිටි නිල නිවස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපළ පිරියත සහ උපකරණ යටතේ ඇතුළත් කර ඇතත් එම නිල නිවස පිහිටි හෙක්ටයාර් 0.0612 ක් වූ ඉඩමෙහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මගින් ඉදිරිපත් කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ සම්බන්ධයෙන් ලිපි යොමු කර තිබුණු අතර තක්සේරු වාර්තාව ප්‍රමාද වීම මත සිහිකැඳවීම් ලිපිද යවන ලදී .ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යන බව දුරකථනයෙන් දන්වන ලදී. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අදාළ ඉඩමේ වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය යටතේ ලියාපදිංචි කර තිබුණු 65-0748 දරන ලෑන්ඩ්රෝවර් ඩිපෙන්ඩර් රථය ලොග් සටහන් පොත අනුව 2007 වර්ෂයේ සිට මෙම දෙපාර්තමේන්තුව යටතේ රාජකාරි සඳහා යොදාගෙන තිබුණද අදාළ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම රථය පවරාගැනීමට අදාළ කටයුතු ප්‍රමාද වී ඇත්තේ වාහනයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත අස්ථානගත වීම (එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය භාරයේ පැවතීමේදී) හේතුවෙන් මෝටර් රථවාහන දෙපාර්තමේන්තුව වෙතින් දෙවන පිටපතක් ලබා ගැනීමට අදාළව කටයුතු සම්පූර්ණ කර ගැනීම ප්‍රමාද වීම මතය. දෙවන පිටපත ලබා ගැනීම සඳහා කොමසාරිස් ජනරාල් , මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් කර ඇත. | වාහනයේ අයිතිය දෙපාර්තමේන්තුව නමින් පවරා ගැනීමට අවශය කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක 53- 0049 දරන රථය 2018 පෙබරවාරි 01 වන දින සිට දෙපාර්තමේන්තු රථ ගාලේ ගාල් කර තිබී 2020 ජූලි 09 දින පත් කළ වාහන හඳුනා ගැනීමේ විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් විසින් අපහරණය කිරීම සුදුසු බවට නිර්දේශ කර තිබියදී 2022 මාර්තු 25 වන දින මෙම රථය පුද්ගලික ඉංජිනේරු සමාගම වෙත වාහන අලුත්වැඩියා කිරීමේ හැකියාවක් පවතී ද යන්න පිළිබඳව නැවත පරීක්ෂාවකට රැගෙන ගොස් තිබුණද 2023 මාර්තු 13 දින දක්වා වාහනය අලුත්වැඩියා කළ හැකිද නොහැකිද යන්න දන්වා නොමැති අතර වාහනය නැවත රැගෙන ඒමද සිදු වී නොතිබුණි. | රජයේ ආයතන සඳහා නව වාහන ලබා නොදීම මත දෙපාර්තමේන්තුවේ පවතින වාහන හිඟය සලකා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව 53- 0049 කැබ් රථය අලුත්වැඩියා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම වෙත යොමු කර ඇත. මේ වන තෙක් ඒ පිළිබඳ වාර්තාවක් නොලැබීම හේතුවෙන් ඉඩම් අමාත්‍යාංශයේ යාන්ත්‍රික ඉංජිනේරු, කොමසාරිස් (පාලන) හා ප්‍රවාහන අංශයේ නිලධාරීන් විසින් එම ආයතනය වෙත ගොස් පරීක්ෂා කර බලා ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. අලුත්වැඩියාවට අදාළ ඇස්තමේන්තුව කඩිනමින් අප වෙත ලැබීමට සලස්වන බව ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක ඉංජිනේරු විසින් දැනුම් දෙන ලදී. ඒ අනුව යාන්ත්‍රික ඉංජිනේරු ප්‍රධානත්වයෙන් ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිර්දේශ හා ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගමේ ඇස්තමේන්තු පදනම් කරගෙන අලුත්වැඩියාව සඳහා ඇති සක්‍යතාවය හා ආර්ථිකමය වටිනාකම මත | නොපමාව මෝටර් රථය අලුත්වැඩියා වට හෝ අපහරණයට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පදනම්ව මෙම රථයේ ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | |
| (ඈ) | අංක 32 – 3129 දරන කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම 2021 නොවැම්බර් 15 දින සිදුකර එය පෞද්ගලික ආයතනයක් වෙතින් අලුත්වැඩියාව සිදු කිරීමට ජනාධිපති ලේකම් කාර්යාල (යාන්ත්‍රික ඉංජිනේරු ) වෙතින් ඒ සඳහා නිර්දේශය ලැබී තිබුණද 2023 මාර්තු 13 දින වන විටත් අදාළ අලුත්වැඩියාව සිදුකර නොතිබුණි. | නාත්තණ්ඩිය ප්‍රාදේශිය කාර්යාලයේ සිට ප්‍රධාන කාර්යාලය වෙත භාරදී ඇති 32-3129 කැබ් රථය සඳහා 2022.11.15 දින කැඳවූ මිල ගණන් වලට අනුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකි වූයේ 2022 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමතිවීම නිසාවෙනි. පසුව අමාත්‍යාංශයීය යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමුකර හඳුනාගත් අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් ඇතුළත් වාර්තාවට අනුව මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | ප්‍රතිපාදන ලබාගෙන කඩිනමින් අලුත් වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අංක KH – 5711 ජීප් රථයෙහි එන්ජිමේ සම්පූර්ණ අලුත්වැඩියාවක් 2021 මාර්තු 01 වන දින සිදුකර පළමු සේවාව සඳහා 2021 අගෝස්තු 09 වන දින නැවත එම ආයතනයට රථය භාර දී ඇතත් විගණිත දිනය වන 2023 මාර්තු 15 වන දින වන විට වසර 01 මාස 07 ක් ගත වී ඇතත් වාහනය නැවත දෙපාර්තමේන්තුව වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ජීප් රථයේ එන්ජිමේ සම්පූර්ණ අලුත්වැඩියාවක් 2021.03.01 දින කි.මී. 60000 වගකීම් කාලයකට යටත්ව පී.එස්.ඩී. මෝටර් වර්ක්ස් ආයතනය වෙතින් සිදු කළ අතර වගකීම් කාලය ඇතුළත යෙදුනු ප්‍රථම වාර සේවාව නිදහස් වාර සේවාවක් බැවින් 2021.08.09 දින එම ආයතනය වෙත යොමු කරන ලදී. නමුත් පෙර සිදු කරන ලද එන්ජින් අලුත්වැඩියාව ආශ්‍රිත දෝෂ නැවත නැවත මතු වන බව රියදුරුගේ වාචික දැනුවත් කිරීම මත එම දෝෂ පරීක්ෂා කිරීම සඳහා වාර සේවාව සිදුකිරීමට යොමු කළ අවස්ථාවේදීම කටයුතු කර ඇත. ඒ සම්බන්ධයෙන් වාර්ථාවක් මේ වන තෙක් එවා නොමැති නිසාවෙන් එය කඩිනමින් ලබා දෙන ලෙසට ලිපි මගින් දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අලුත් වැඩියා නිසි පරිදි ඉටුකර තිබේද යන්න නැවත තහවුරුවක් ලබා ගත යුතුය. |
| (ඊ) | අංක PF7885 දරන වාහනයේ අලුත්වැඩියාවටරු.182,696 ක් 2021 දෙසැම්බර් 29 දින ගෙවා තිබුණි. තවද මෙම අලුත්වැඩියාව සඳහා ජපන් අමතර කොටස් යොදා ගන්නා බව ඇස්තමේන්තුවේ දක්වා තායිලන්ත අමතර කොටස් භාවිතා කර එය සිදු කර ඇති බවට 2021 දෙසැම්බර් 28 දින රියදුරු විසින් දන්වා තිබුණද අලුත්වැඩියාවට සම්බන්ධ ලිපිගොනුව අස්ථානගත විම මත අදාළ කරුණ සම්බන්ධව පරීක්ෂාවක් සිදු නොකිරිම පිළිබඳව එම වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | PF -7885 අංක දරන වාහනයේ 2021.10.28 දින සිදුකරන ලද අලුත්වැඩියාවට අදාළ ලිපි ඇතුළත් ගොනුව අස්ථානගත වී ඇති බැවින් ප්‍රවාහන පොදු ගොනුව මගින් නැතිවූ ගොනුව පිළිබඳ අදාළ අංශ වෙතින් සටහන් පත් යොදාගෙන නව ගොනුවක් සාදා ඇත. එසේම එම ගොනුව අස්ථානගත වීම සම්බන්ධයෙන් එවකට සිටි විෂය භාර නිලධාරියාගෙන් කරුණු විමසීම සිදු කර ඇති අතර ඉඩම් අමාත්‍යාංශය මගින් මේ සඳහා මූලික පරික්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලීමක් යොමු කර ඇත. | වාහනයේ සවිකර ඇති අමතර කොටස් නිසි පරීක්ෂාවක ට ලක්කළ යුතුය . |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධව පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් පිළිබඳව තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතුය. එසේ ඇප තැබිය යුතු නිලධාරීන් 75 ක් දෙපාර්තමේන්තුව තුළ සිටියද ඇප තබා ඇති නිලධාරීන් ගණන 5 ක් විය. | නිලධාරීන්ගෙන් පස්(05) දෙනෙක් දැනට ඇප තබා ඇති අතර ඉතිරි නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරියේදී ඇප තැබීමට පාස් පොත් විවෘත කිරීමට කටයුතු කරගෙන යන බවද කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගත යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රාදේශීය කාර්යාල කඩිනමින් විවෘත කිරීමේ මූලික පියවරක් ලෙස 2013,2014 සහ 2015 වර්ෂ වලදී දෙපාර්තමේන්තුවට අනුයුක්ත සංවර්ධන නිලධාරී පත්වීම් 06 එම ප්‍රදේශ වල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තාවකාලිකව අනුයුක්ත කර ඇතත් එම ප්‍රදේශ වල දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම හෝ ඒ සඳහා ගත යුතු මූලික පියවරයන් නොගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය තුළ එම නිලධාරීන් 5 දෙනෙකු වෙත වැටුප් දීමනා සහිතව රු.2,827,836 ක මුදලක් ගෙවා තිබුණි. එක් නිලධාරිනියකගේ වැටුප් හා දීමනා විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර එම නිලධාරීන්ගේ රාජකාරී හා පරිපාලන කටයුතු වලට දෙපාර්තමේන්තුව සම්බන්ධ නොවන අතර, වැටුප් හා දීමනා ගෙවීම පමණක් සිදු කර තිබුණි. | මුලතිව්,කිලිනොච්චි හා යාපනය දිස්ත්‍රික්ක තුනෙහි ඔඩ්ඩුසුඩාන්,මාන්තායි,හා පච්චිලායිපල්ලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම දෙපාර්තමේන්තුවේ යෝජිත ප්‍රාදේශීය කාර්යාල වල ට මෙම නිලධාරීන් බඳවා ගන්නා ලදී. මෙම ප්‍රදේශයන්හි බලාත්මක වන තේසවලාමේ පොදු නීතිය යටතේ ක්‍රියාත්මක වන “සහ අයිතිය” (CO-Ownership)යන නීති කරුණ සහ අප දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අතර පරස්පරතාවයක් පවතින බැවින් ඒ පිළිබඳව නීතිපති උපදෙස් ඉල්ලා ඇත. එම උපදෙස් ලද වහාම උක්ත කාර්යාල අලුතින් ආරම්භ කිරීමට අරමුණු කර ඇත. ඒ හේතුවෙන් අඛණ්ඩව මෙම නිලධාරීන් උක්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කරන ලදී. එසේ වුවද අවම කාර්යාල ප්‍රමාණයකින් කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන බැවින් මෙම නිලධාරීන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත නිදහස් කිරීමට දෙපාර්තමේන්තු මට්ටමින් කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන් තුවේ පුරප්පාඩු පවතින ස්ථාන වෙත මෙම නිලධාරීන් අනුයුක්ත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 පෙබරවාරි 07 දින පත්වීම් ලබා දෙන ලද නිලධාරීන් 08 දෙනෙකු වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සංවර්ධන නිලධාරී තනතුර සඳහා අනියුක්ත කර දෙපාර්තමේන්තු රාජකාරී ඉටු කරගැනීමකින් තොරව මාස11 ක කාලයකට රු.4,467,690 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | වවුනියා ප්‍රාදේශීය කාර්යාලයට දමිළ භාෂාවෙන් වැඩ කිරීමට හැකි නිලධාරීන් 08ක් බඳවා ගන්නා ලද අතර පසුගිය වර්ෂයේ කාර්යාලය පිහිටුවීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණු බැවින් එම නිලධාරීන් වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙ තවදුරටත් රඳවා තබා ගැනීමට සිදුවිය .නමුත් වර්ෂයේදී වවුනියා දිස්ත්‍රික් කාර්යාලය පිහිටුවීම සඳහා සහකාර කොමසාරිස් වරයෙකු යෝජනා කර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත .එම නිසා යෝජිත දිස්ත්‍රික් කාර්යාලය වෙත මෙම නිලධාරීන් අනුයුක්ත කළ හැකි බව දන්වා සිටිමි . තවද මෙම නිලධාරීන් මන්නාරම් දිස්ත්‍රික්කය තුළ හිමිකම් නිරවුල් කිරීමේ රාජකාරි වලදී භාෂා පරිවර්ථන කටයුතු වලට අදාළ රාජකාරි කටයුතු ද සිදු කරයි. | වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය ආරම්භ කිරීම හෝ නිලධාරීන් පුරප්පාඩු පවතින වෙනත් කාර්යාලයන් වෙත අනුයුක්ත කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | මැනුම් ඉල්ලීම් යැවීමේ සිට බිම් සවිය වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය ශූන්‍ය අගයක් ගෙන තිබුණද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කාර්යාලය පවත්වාගෙන යාම වෙනුවෙන් කාර්යාල කුලී ලෙස රු. 1,116,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ගෙවා තිබුණි. | ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය කාර්යාලයේ භෞතික ප්‍රගතිය ශූන්‍ය වී ඇත්තේ 1998 අංක 21 දරන නිරවුල් කිරීමේ පනත ප්‍රකාරව රාජකාරි කටයුතු සිදු කිරීමේදී 14 වගන්තියෙන් ප්‍රධාන කාර්යාලය වෙත ලේඛන අනුමත කර යැවීම සඳහා නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරයෙකු කාර්යාලය වෙත අනුයුක්ත නොසිටීම හේතුවෙනි. එසේ වුවද පනත ප්‍රකාරව 14 වගන්තියේ අනුමැතියට පූර්වයෙන් සිදු කළ යුතු සියලු පියවරයන්හි කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති නිලධාරී විසින් සිදුකර ඇත. 2023.02.14 දින ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ ප්‍රාදේශීය කාර්යාලයට සහකාර කොමසාරිස්වරයෙකු පත් කර ඇති නිසා පූර්වයෙන් සකස් කළ ගොනුවල ඉදිරි රාජකාරී වර්තමානයේ දී සිදු වෙමින් පවතී.14 වගන්තිය යටතේ අනුමත කර ගැසට් කිරීමට අදාළව පනත ප්‍රකාරව කටයුතු කිරීම වෙනුවෙන් අනුයුක්ත කළ නිලධාරීන් එම කාර්යයන් ඉටු කර ඇත. | කාර්යාලය ඵලදායි ලෙස පවත්වා ගත යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගෙන තිබුණද, අදාළ අරමුණු එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ස්ථාපිත කරනු ලැබූ තිරසර සංවර්ධන අරමුණු සමඟ සම්බන්ධ වන ආකාරය සහ 2030 වර්ෂය දක්වා කාලය තුළ | එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ස්ථාපිත කරනු ලැබූ තිරසර සංවර්ධන අරමුණු වලට අදාළව අංක 1 ලෙස දක්වා ඇති " සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම"දෙපාර්තමේන්තු විෂය පථය අනුව හඳුනාගෙන ඇත.අරමුණ හා සම්බන්ධ ඉලක්කය වශයෙන් "1.4 විශේෂයෙන් දරිද්‍රතාවයෙන් | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක නිශ්චිතව හඳුනා ගෙන 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් වාර්ෂිකව ඉටුකර ගැනිමට අපේක්ෂිත ඉලක්ක හා ප්‍රගතිය පිළිබඳ සඳහන් කර නොතිබුණි. ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ දායකත්වය නිශ්චිතව ඉදිරිපත් කර නොතිබුණි. | පෙලෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පුද්ගලයින්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරිම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම, ද එහි දර්ශකය වශයෙන් “ 1.4.2 ස්ත්‍රී පුරුෂ හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිට ජනගහනය ” ද, මෙම දෙපාර්තමේන්තුවට සම්බන්ධ වේ. ඉහත අරමුණට අදාළව 2030 වර්ෂය දක්වා කාලය තුළ මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්කය වන්නේ ඉඩම් අයිතිය තහවුරු කර නියම උරුමකරුවන් හට හිමිකම් ප්‍රකාශ කිරීම සඳහා රජයේ පූර්ණ වගකීම යටතේ හිමිකම් සහතිකයක් ලබාදීම වේ. 2030 වන විට ශ්‍රී ලංකාවේ සමස්ත ඉඩම් කැබලි ප්‍රමාණය සඳහා රජයේ පූර්ණ වගකීම යටතේ නිරවුල් හිමිකම් සහතිකයක් ලබා දීමෙන් ඉහත අරමුණට ළඟාවීමට අපේක්ෂිත දායකත්වය ලබාදීමට බලාපොරොත්තු වේ. | |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 71 ක්,ද්විතියක හා තෘතීක මට්ටමේ පුරප්පාඩු 938 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 1121 ක් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල ක් පිහිටුවීමට සැලසුම් කර ඇති අතර දැනට කාර්යාල 91 කින් 48ක් පිහිටුවා රාජකාරි කටයුතු සාර්ථකව ඉටු කරමින් පවතී. ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු අතරින් 20ක් වැඩ බලන නිලධාරීන් සිටින අතර ප්‍රාදේශීය කාර්යාල 05 ක නියෝජ්‍ය/සහකාර කොමසාරිස් පුරප්පාඩු පවතී. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු පුරවන ලෙස වරින් වර රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළද මේවන තෙක් එම ඉල්ලීම් ඉටු වී නොමැති අතර එම පුරප්පාඩු නොපිරවීම මත තෘතීය, ද්විතීය මට්ටමේ පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. | අවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජ්‍යෝෂ්ඨ මට්ටමේ නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුරු 04 ක් සඳහා ස්ථිරවම නිලධාරීන් පත් නොකර කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම සිදුකර තිබුණි. | පුරප්පාඩු පිරවීම සිදු කරන තෙක් සේවයේ අවශ්‍යතාවය මත සහකාර කොමසාරිස් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් පත් කර තිබුණද රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/HB/01/2022 හා 2022.05.25 දිනැති ලිපියෙන් විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත දැනුම් දෙන තුරු සේවයේ නොයොදවන ලෙස කරන ලද දැනුම් දීම අනුව එම නිලධාරීන්ගේ සේවා කාලය අවසන් කරන ලදී. | ස්ථිර කාර්ය මණ්ඩලය මගින් අවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ද්විතීක හා තෘතික මට්ටමේ තනතුරු 09 ක පවතින 1048 ක පුරප්පාඩු පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය සලකා බලා අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ද්විතියික මට්ටමේ පුරප්පාඩු පුරවන ලෙස වරින් වර ඉල්ලීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති අතර**,**කාර්යාල සේවක සේවයේ හා රියදුරු සේවයේ පුරප්පාඩු 20ක් බහුකාර්ය සංවර්ධන සහායකයින් මගින් පුරවා දෙන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/SEC/01/09 හා 2023.01.27 දිනැති ලිපියට අනුව ඉල්ලීම් කර ඇති අතර, බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා අධ්‍යක්ෂ ජනරාල් වෙතද ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | අවශ්‍ය පුරප්පාඩු පිරවීමට හෝ කාර්යය මණ්ඩලය සංශෝධනයට කටයුතු කළ යුතුය. |